# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2009 අංක 43 දරන පූජ්‍ය මූණමලේ ධම්මරතන ගුණානුස්මරණ පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 අගෝස්තු මස 17 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 අගෝස්තු මස 21 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 6.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

## 2009 අංක 43 දරන පූජ්‍ය මූණමලේ ධම්මරතන ගුණානුස්මරණ පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2009 අගෝස්තු මස 17 වන දින]

එල්. ඩී.—ඕ. (අයි.එන්.සී) 19/2007.

### පූජ්‍ය මූණමලේ ධම්මරතන ගුණානුස්මරණ පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

"පූජ්‍ය මූණමලේ ධම්මරතන ගුණානුස්මරණ පදනම" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පදනමක් එකී සාමාජිකයන් එකඟ වූ රීති එනුව, එහි පරමාර්ථ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ ඊට අදාළ කාරණා ඵලදායී ලෙස කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද: පූර්විකාව.

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර හා ඉටු කර ඇති හෙයින් ද, එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති බැවින් ද, ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2009 අංක 43 දරන පූජ්‍ය මූණමලේ ධම්මරතන ගුණානුස්මරණ පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට හා ඉන් පසුව (මෙහි මින්මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) පූජ්‍ය මූණමලේ ධම්මරතන ගුණානුස්මරණ පදනමේ දැනට සාමාජිකයන් වශයෙන් සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින්මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "පූජ්‍ය මූණමලේ ධම්මරතන ගුණානුස්මරණ පදනම" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තව ද, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය. තව ද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඊට ඇත්තේ ය. පූජ්‍ය මූණමලේ ධම්මරතන ගුණානුස්මරණ පදනම සංස්ථාගත කිරීම.

2-PL 003906 -2,740 (2009/06)

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) පන්නල, යටිගල්ඔළුවේ ශ්‍රී පුන්‍යවර්ධනාරාම විහාරස්ථානයේ විහාරාධිපතිව අපවත් වූ මූණමලේ ධම්මරතන ස්ථවිරයන් සැමරීම සඳහා ප්‍රතිමාවක් ඉදි කිරීම, උන්වහන්සේගේ නම සැමරීම සඳහා ආගමික හා වෙනත් උත්සව සංවිධානය කිරීම සහ මූණමලේ ධම්මරතන ස්ථිවිරයන්ගේ ජීවිතය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා කටයුතු සංවිධානය කිරීම;

(ආ) බෞද්ධාගමිකයන්ට සහාය වීමේ අදහස ඇතිව පෙර පාසල්, ළමා සුරැකුම් මධ්‍යස්ථාන, ළමා නිවාස, ළමා අධ්‍යාපනය සහ ආගමික අධ්‍යාපනය සම්බන්ධයෙන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම;

(ඇ) දුප්පත්කම සහ වෙනත් නොහැකියාවන් නිසා තම අධ්‍යාපනය කරගෙන යාමට අපහසු ශ්‍රී ලාංකික බෞද්ධ ශිෂ්‍යයන්ගේ ශුභ සාධනය සහ යහපත වැඩිදියුණු කිරීමෙහිලා ආධාර කිරීම ;

(ඈ) බෞද්ධ තරුණයන්ගේ අධ්‍යාපනය සංවර්ධනය කිරීම සහතික කිරීමේ අදහස ඇතුව අවශ්‍ය පන්ති, දේශන, පුස්තකාල, සම්මන්ත්‍රණ, සම්මේලන, වැඩමුළු, සාකච්ඡා, වාද විවාද, අධ්‍යාපන චාරිකා, ප්‍රදර්ශන, සහ සංදර්ශන පැවැත්වීම ; සහ පුවත්පත් සහ සඟරා ප්‍රකාශයට පත් කිරීම ;

(ඉ) බෞද්ධාගමිකයන් වන්නාවූ, ශාරීරික හා මානසික දුබලතා සහිත අසරණයන්, දිළිඳු අය, මහලු අය සහ අසරණයන් සඳහා ආධාර සහ නිවාස වැනි සහන සේවා සැලසීම;

(ඊ) බෞද්ධ තරුණයන් ඵලදායක සේවාවල යෙදවීම සඳහා භාෂා පුහුණු සහ වෘත්තීය පුහුණු පාඨමාලා ආරම්භ කිරීම සහ තවදුරටත් සහය වශයෙන් ආදායම් උපයන කටයුතු වල නියැලීමට පහසුකම් සැලසීම ;

(ඌ) ළමා සෞඛ්‍යය හා වැඩිහිටි සෞඛ්‍යයට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ රෝග පාලනය පිළිබඳ අධ්‍යාපනය ලබා දීම සහ බෞද්ධාගමිකයන්ගේ යහපත උදෙසා සායන, ජිම්නාස්ටික් ක්‍රීඩාගාර සහ වෛද්‍ය සායන පැවැත්වීම ;

(ඍ) අඩු ආදායම් ලබන බෞද්ධාගමික ජනතාව අතර සමාජ සංවර්ධන කටයුතු සඳහා ස්වයං ආධාර සහ ස්වේච්ඡා සේවා ලබා දීම සහ ඒ සම්බන්ධයෙන් නියමු ව්‍යාපෘති ආරම්භ කොට පවත්වාගෙන යාම ;

(එ) යම් කර්මාන්තයක හෝ වෙළඳාමක හෝ අපනයන හෝ ආනයන ව්‍යාපාරයක නියැලීම සහ කෘෂිකාර්මික, කාර්මික සහ වාණිජ ව්‍යවසායන් ආරම්භ කොට ක්‍රියාත්මක කිරීමට බෞද්ධාගමිකයන්ට ආධාර හෝ සහය ලබා දීම සහ පුහුණු වැඩ සටහන් සහ ව්‍යාප්ත සේවා භාර ගැනීම සහ තාක්ෂණය හුවමාරු කර ගැනීම සම්බන්ධයෙන් ප්‍රචාරක කටයුතු සංවිධානය කිරීම ;

(ඒ) යටිගල්ඔළුවේ පන්නල, පුන්‍යවර්ධනාරාම විහාරස්ථානය සඳහා අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීම සහ පවත්වාගෙන යාම;

(ඔ) බෞද්ධ ගිහියන්ගේ ආගමික අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම ;

(ඕ) පන්නල යටිගල්ඔළුවේ ශ්‍රී පුන්‍යවර්ධනාරාමයේ නේවාසික භික්ෂූන්ට අධ්‍යාපන පහසුකම් ලබා දීම සහ ඔවුන්ගේ දෛනික අවශ්‍යතා සපුරා ලීම;

(ක) පන්නල යටිගල්ඔළුවේ ශ්‍රී පුන්‍යවර්ධනාරාමය පිහිටි ගමේ සහ ඒ අවට ප්‍රදේශයේ පුරාණ කලා කටයුතු ඇතුළු සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය කිරීම;

(ග) බුද්ධ ධර්මය ජාත්‍යන්තර වශයෙන් පැතිරවීමේ නියැලීම ;

(ච) බෞද්ධ දර්ශන සහ බෞද්ධ ජීවන රටාව ආරක්ෂා කිරීම සහ පැතිරවීම ;

(ජ) ශ්‍රී ලංකාවේ සහ වෙනත් රටවල වෙනත් බෞද්ධ සංවිධාන සමග මිත්‍ර සම්බන්ධතා ඇතිකර ගැනීම ; සහ

(ට) බෞද්ධාගමිකයන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම මඟින් බෞද්ධ අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සහ බෞද්ධ අධ්‍යාපනය සඳහා පිරිවෙන් පිහිටුවීම සහ පවත්වාගෙන යාම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

4. (1) සංස්ථාවේ කටයුතු සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන හෝ පත් කරගනු ලබන සභාපති, උපසභාපතිවරු සහ වෙනත් ධූර දරන්නන්ගෙන් සමන්විත (මෙහි මින්මතු “මණ්ඩලය” යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලයක් විසින්, 6 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතිවලට යටත්ව, පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පදනමේ කළමනාකරණ මණ්ඩලයේ ධූර දරමින් සිටි සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

5. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන වලට යටත්ව සංස්ථාවේ පරමාර්ථ හෝ ඉන් එක් පරමාර්ථයක් වැඩිදියුණු කිරීම හෝ සාක්ෂාත් කර ගැනීම, සඳහා අවශ්‍ය හෝ අපේක්ෂිත සියලු ක්‍රියා, කාරණා, සහ දේ කිරීම, ඉටු කිරීම හා ක්‍රියාත්මක කිරීම ඇතුළු පහත දැක්වෙන දෑ කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය:—

(අ) සංස්ථාවේ කාර්යය සඳහා අවශ්‍ය වන යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම, හුවමාරු කිරීම හෝ වෙනත් යම් ආකාරයකින් නීයාදනය කිරීම, බැඳීමකට යටත් කිරීම හෝ බැහැර කිරීම ;

(ආ) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පමුණුවා ගැනීම සඳහා හෝ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන සියලු ගිවිසුම් වලට හෝ කොන්ත්‍රාත්තුවලට කෙලින්ම හෝ සංස්ථාව විසින් බලය පවරනු ලැබූ සංස්ථාවේ යම් නිලධරයකු හෝ අනුයෝජිතයකු මාර්ගයෙන් ඇතුළත්වීම ඒවා ඉටු කිරීම හෝ ක්‍රියාත්මක කිරීම ;

(ඇ) මුදලින් හෝ ද්‍රව්‍යවලින් ත්‍යාග, පරිත්‍යාග හෝ රික්තවරණ භාර ගැනීම ;

(ඈ) ස්වකීය අරමුදල් ආයෝජනය කිරීම සහ යම් බැංකුවක ජංගම, තැන්පතු සහ ඉතිරි කිරීමේ ගිණුම් පවත්වාගෙන යාම ;

(ඉ) සංස්ථාවේ කාර්යය සඳහා අවශ්‍ය වන මුදල් සුදුසු යයි සංස්ථාව විසින් සඳහන් කරනු ලබන ආකාරයට සහ එසේ සුදුසු යයි සලකනු ලබන ඇප මත ණයට ගැනීම හෝ ආයෝජනය කිරීම ;

(ඊ) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙහි යෙදවීම, මාරු කිරීම, ඔවුන් විෂයෙහි විනය පාලනය පවත්වා ගෙන යාම.

සංස්ථාවේ රීති.

6. (1) සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් පහත දැක්වෙන කාරණා සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් හෝ විධිවිධානවලට අනනුකූල නොවන රීති සංස්ථාව විසින් කලින් කල සාදනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය:—

(අ) සාමාජිකත්වය වර්ග කිරීම සහ සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉල්ලා අස්වීම හෝ නෙරපීම;

(ආ) ධුර දරන්නන් තෝරා පත් කර ගැනීම, ධුර දරන්නන්ගේ ධුරයෙන් ඉල්ලා අස්වීම, ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල සහ කාර්යය;

(ඇ) මණ්ඩලයේ නිලධරයන් තෝරා පත්කර ගැනීම සහ එහි බලතල, චර්යාව සහ කාර්යය;

(ඈ) සංස්ථාවේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන්ගේ බලතල, චර්යාව, කාර්යය සහ කර්තව්‍යය;

(ඉ) මණ්ඩලයේ රැස්වීම්වලදී අනුගමනය කල යුතු කාර්ය පටිපාටිය හෝ මණ්ඩලයේ රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම, ඒ රැස්වීම් පවත්වන ස්ථාන, වේලාව, ඒ පිළිබඳ දැන්වීම් සහ ඒවායේ ගණපූරණය සහ එම රැස්වීම්වල කටයුතු කරගෙන යාම; සහ

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය සහ කළමනාකරණය, සහ එහි අරමුදල් භාරව සිටීම.

(2) සංස්ථාව විසින් සාදනු ලබන සෑම රීතියක්ම, (1) වන උප වගන්තිය යටතේ එවැනිම රැස්වීමකදී එවැනිම ආකාරයට සාදන ලද රීතියක් ලෙස සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සෑම කල්හිම සංස්ථාවේ තත්කාලයේ බලපවත්වන රීතිවලට යටත් විය යුතු ය.

සාමාජිකයන්ගේ නාමලේඛනය.

**7.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ දී සාමාජිකයන්ව සිටි සෑම තැනැත්තන් පිළිබඳ සහ මින්පසු සංස්ථාවේ සාමාජිකයන් ලෙස ඇතුළත් කර ගනු ලබන සෑම තැනැත්තන් පිළිබඳ නාම ලේඛනයක් පවත්වාගෙන යාමට මණ්ඩලය කටයුතු සැලැස්විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**8.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, ත්‍යාග, තෙස්තමේන්තු නීයාදන, පැවරුම්, පරිත්‍යාග, සම්මාදම් මුදල්, දායක මුදල්. ගාස්තු, ප්‍රදාන හෝ මුල්‍ය ආයෝජන වශයෙන් මේ දක්වා ලැබූ හෝ මින්මතු සංස්ථාවට ලැබෙන හෝ සියලු මුදල්, මණ්ඩලය විසින් තීරණය කරනු ලබන බැංකු එකක හෝ වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ බලතල සහ කාර්යය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා සංස්ථාව විසින් දරනු ලැබූ සියලු වියදම් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

විගණනය හා ගිණුම්.

**9.** (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබාගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම්, මණ්ඩලය විසින් පත් කරනු ලබන සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා ඒ ආයතනය විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ii) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා ඒ ආයතනය විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද සාමාජිකයන්ගෙන් යුත් එවැනි ගණකාධිකාරී සමාගමක් අදහස් වේ.

**10.** සංස්ථාවේ මුද්‍රාව ලේකම්වරයාගේ භාරයේ තිබිය යුතු අතර, සංස්ථාවේ සභාපතිවරයා සහ ලේකම්වරයා හෝ මණ්ඩලය විසින් යථා පරිදි බලය දෙන ලද තැනැත්තකු ඉදිරිපිටදී හැර කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, ඔවුන් පැමිණ සිටින බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි ඔවුන් විසින් තම නම අත්සන් කළ යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය. සංස්ථාවේ මුද්‍රාව.

**11.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පදනම විසින් ගෙවිය යුතු සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර, එදිනට පදනමට අයවිය යුතු සියලු ණය, පදනමට ගෙවිය යුතු සම්මාදම් මුදල් සහ දායක මුදල්, මේ පනතේ කාර්යය සඳහා සංස්ථාව වෙත ගෙවනු ලැබිය යුතු ය. පදනම විසින් ගෙවිය යුතු සහ පදනමට අයවිය යුතු ණය මුදල්.

**12.** කවර ආකාරයෙන් හෝ ලබා ගන්නා සංස්ථාවේ මුදල් හා දේපළ මෙහි දක්වා ඇති සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම කෙරෙහි පමණක් අදාළ කරගත යුතු අතර, එහි යම් කොටසක් සංස්ථාවේ සාමාජිකයන් වෙත සෘජුවම හෝ වක්‍රව ලාභාංශ, ප්‍රසාද දීමනා, ලාභ හෝ වෙනත් දෙයක් වශයෙන් ගෙවීම හෝ පැවරීම නොකළ යුතු ය. මුදල් සහ දේපළ අදාළ කර ගැනීම.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**13.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදනයක් හෝ වෙනත් යම් ආකාරයකින් හෝ සංස්ථාව සතුවන චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට මේ පනතේ විධිවිධානවලට යටත්ව නීතියෙන් සංස්ථාවට හැකියාව සහ බලය ඇති අතර, ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව, 6 වන වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාවේ රීතිවලට යටත්ව සංස්ථාවේ කාර්යය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

**14.** සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය හා බැරකම් පියවීමෙන් පසු යම් දේපළක් ඉතිරිවී තිබුණහොත් ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ ලාභයක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කරනු ලබන්නා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුවම සංස්ථාවේ සාමාජිකයන් විසින් එම ආයතනය හෝ ආයතන තීරණය කරනු ලැබිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**15.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවයක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**16.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.